**ශීර්ෂය - 409 අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.
මෙම අමාත්‍යාංශය 2020 වර්ෂයේදී ආරම්භ කළ නව අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොවීය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපළ පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ගිණුම් අනුව මූල්‍ය නොවන වත්කම් රු.9,127,977,355 ක් වුවද, භාණ්ඩාගාර සටහන් අනුව එය රු.9,283,024,799 ක් වූයෙන් රු.155,047,444 ක වෙනසක් විය. | පෙර පැවති අමාත්‍යාංශය වෙත වත්කම් ගිණුම්ගත කිරීම ප්‍රමාද වීම නිසා අභ්‍යන්තර කටයුතු අංශයට අදාල රු.41,582,000 ක් භාණ්ඩාගාර පොත්වල නියමිත දිනට වාර්තා වී නොතිබුණි. මේ වන විට නිවැරදි කර ඇත. මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම රු.182,599,809 නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති බව දන්වමි. | භාණ්ඩාගාර සටහන් සමග සංසන්දනය කර නිවැරදි ශේෂය දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශේෂ කාර්ය බලකායේ භාණ්ඩාගාර සටහන් අනුව ස්ථාවර වත්කම් වල වටිනාකම රු.7,387,722,300 ක් වුවත් එහි ස්ථාවර වත්කම් ලේඛනය අනුව එය රු.7,388,679,748 ක් වූ බැවින් රු.975,448 ක වෙනස එම වටිනාකම් අතර විය. | මෙම වරද 2021 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව විශේෂ කාර්ය බලකායෙන් මාවෙත වාර්තා කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | -එම- |

### 1.6.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම අමාත්‍යාංශය යටතේ ඇති ස්වදේශ කටයුතු අංශයේ, ආපදා කළමනාකරණ අංශයේ හා අභ්‍යන්තර කටයුතු අංශයේ පොත් අනුව අත්තිකාරම් ශේෂයන් හා භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ශේෂයන් අතර පිළිවෙලින් රු.57,913,974 ක, රු.49,481,591 ක හා රු.8,432,382 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසට හේතුව වී ඇත්තේ දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පොත්වල අගයන් අතර වෙනසට හේතු පැහැදිලි කරන සැසඳුම් ප්‍රකාශය සකස් කිරීමේදී එකතු කරන ලද රු.2,138,453 ක හා අඩුකරන ලද රු.10,570,835 ක අගයන් අතර වෙනස බව දන්වමි. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර සටහන් අනුව සැසඳීම් කර නිවැරදි ශේෂයන් දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අග්‍රිම ගිණුම් ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර සටහන් අනුව අග්‍රිම ශේෂය ලෙස රු.4,063,721,374 ක් දක්වා තිබුණද, ශේෂ පිරික්සුමේ ඊට වෙනස් අගයන් සහිතව අග්‍රිම ශේෂය දක්වා තිබුණි. ඒ අනුව ශේෂ පිරික්සුමේ භාණ්ඩාගාරයෙන් ලැබු අග්‍රිමය ලෙස රු.4,048,890,132 ක බැර ශේෂයක් ද, 7002 අග්‍රිම ගිණුම ලෙස රු.4,109,685,986 ක හර ශේෂයක්ද සහ රු.4,124,427,372 ක බැර ශේෂයක්ද දක්වා තිබුණි. | භාණ්ඩාගාර සටහන් අනුව සඳහන් කරන ලද රු.4,063,721,374ක අග්‍රිම මුදල තුල සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වෙනත් මුලාශ්‍ර වලින් ලද රු.60,705,997ක මුදලක් ඇතුලත් වී ඇත. | අග්‍රිම ශේෂය නිවැරදිව දැක්විය යුතුය. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රාජ්‍ය අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වදේශ කටයුතු අංශය, ආපදා කළමනාකරණ අංශය, විශේෂකාර්ය බලකා අංශය, අභ්‍යන්තර කටයුතු අංශය හා අභ්‍යන්තර ආරක්ෂක යන අංශ විසින් ණය අත්තිකාරම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. | සෑම අංශයක් වෙතම ණය අත්තිකාරම් ලේඛණ විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | ණය අත්තිකාරම් ලේඛන විධිමත්ව පවත්වාගත යුතුය. |
| (ආ) | විශේෂකාර්ය බලකායේ, ආපදා කළමනාකරණ අංශයේ, ස්වදේශ කටයුතු අංශයේ පොදු තැන්පත් ලේඛනය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. | පොදු තැන්පත් ලේඛණය විධිමත්ව පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු තැන්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව අභ්‍යන්තර කටයුතු අංශය විසින් බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතුය. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වුවත් අභ්‍යන්තර කටයුතු අංශයේ හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන ගිය අතර යාවත්කාලීන කිරීමට 2020 වර්ෂයේ හානි පාඩු කිසිවක් සිදු වී නැති බව දන්වා ඇත. | හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 සැප්තැම්බර් 01 දින ආරම්භ කළ රාජ්‍ය අමාත්‍යාංශයේ ආරම්භක වියදම් ලෙස 2020 ජනවාරි සිට 2020 අගෝස්තු 31 දින දක්වා එවකට පැවති අමාත්‍යාංශ 05 ක වැය විෂයයන් 3 ක් යටතේ වැයකර තිබුණු එකතුව රු.මිලියන 16,303,293,470 ක් අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | නිරීක්ෂණ සමග එකඟ බව දන්වමි. | පෙර පැවති අමාත්‍යාංශයට අදාල වියදම් එම අමාත්‍යාංශය යටතේ දැක්වීමට කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයට වෙන් කර තිබූ රු.27,646,429,000 ක ප්‍රතිපාදනයෙන්, උපයෝජනය රු.25,690,484,007 ක් වූ අතර සියයට 7 ක පමණ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. වැය විෂයයන් 21 ක් සඳහා වෙන් කරන ලද රු.12,735,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. පුනරාවර්තන වැය විෂයන් 38 ක සියයට 20 සිට සියයට 92 ක පරාසයක හා ප්‍රාග්ධන වැය විෂය 30 ක සියයට 17 සිට සියයට 91 ක පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ගෝලීය COVID 19 වසංගත තත්වය, අමාත්‍යාංශ විෂය පථයන් වෙනස්වීම, අමාත්‍යතුමා සඳහා වෙන් වූ වැය විෂයන් හි ප්‍රතිපාදන ඉතිරි වීම, යන්ත්‍ර සූත්‍ර, ලී බඩු, කාර්යාල උපකරණ සහ ගොඩනැඟිලි ආදිය වගකීම් කාල සීමාවන් තුල පැවතීම හේතුවෙන් අදාල නඩත්තු වියදම් අවම වශයෙන් ඇති වීම යන හේතු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 බැඳීම් හා බැරකම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වදේශ කටයුතු අංශයේ රු.1,209,280 ක් ද, විශේෂ කාර්ය බලකායේ රු.6,626,689 ක් ද, අභ්‍යන්තර කටයුතු අංශයේ රු.1,644,575 ද, අභ්‍යන්තර ආරක්ෂක අංශයේ 2,285,345 ක් ද වශයෙන් එකතුව වූ රු.11,765,889 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් යටතේ දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ (409) වැය ශීර්ෂයට අයත් නොවූ වැය විෂයන් 13 කට අදාල රු.1,015,033 ක බැඳීම් හා බැරකම් 2020 වර්ෂයේ 409 වැය ශීර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුල බැඳීම් හා බැරකම් වශයෙන් ඇතුලත් කර නොමැති බව කාරුණිකව දැනුම් දෙමි. වැය විෂයන් 16 කට අදාල රු.133,310 ක් වූ බැඳීම් හා බැරකම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් අනතුරුව සිදු කරන ලද බැඳීම් හා බැරකම් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත්කර නොමැති බව කාරුණිකව දැනුම් දෙමි.<br>අභ්‍යන්තර කටයුතු අංශයේ රු.1,644,575 වන බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැත. විශේෂ කාර්ය බලකා අංශයේ රු.6,626,689 ක් හා අභ්‍යන්තර ආරක්ෂක අංශයේ රු.2,285,345 ක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට බැරකම් ලෙස හදුනාගෙන නොතිබීම හේතුවෙන් දක්වා නොමැත. | වර්ෂයට අදාල සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වදේශ කටයුතු අංශයේ පිළිවෙලින් ස්ථාන මාරු වී ගිය, මියගිය හා සේවය හැරගිය සේවකයන්ගෙන් අය විය යුතු රු.242,700 ක්, 197,400 යක් හා 138,042 ක ණය ශේෂයන් 2021 ජුනි මාසය වන විටත් අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දිගින් දිගටම ගෙවීම් පැහැර හරින බැවින් අග්‍රහාර රක්ෂණය ඇපයට තබා ඇතිහෙයින් ණය මුදල නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස රක්ෂණභාර අරමුදල දැනුවත් කර ඇත. අමාත්‍යාංශයට නොදන්වා විදේශගත වූ නිලධාරිනියගේ ණය ශේෂ නිලධාරිනියගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේ අයකර ගැනීමට අදාල සියලු පාර්ශවයන් දැනුවත් කර ඇත. | ණය ශේෂ නිසියාකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

නීති රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතිරීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------ | --------------- | -------------------------- | ------------ |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ** XXIV වැනි පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය | ආපදා ණය ලබා ගැනීමේදී විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීම සඳහා ලබා දෙනු ලබන අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශය ලබා නොගත් අවස්ථා පැවතිණි. | අදාළ නිලධාරීන්ගෙන් අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා ඇත. | ආපදා ණය ලබා ගැනීමේදී විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීම සඳහා ලබා දෙනු ලබන අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශය ලබා ගත යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | **මුදල් රෙගුලාසි 104(3) සහ 104(4)** | අනතුර සිදුවී දින 07 ක් ඇතුලත ප්‍රාරම්භක වාර්තාවන් ඉදිරිපත් කර අලාභහානියේ වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කර හානිය හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | **මුදල් රෙගුලාසි 565(5)** | එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊලග මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යවා නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාලව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2020 ඔක්තෝබර් 14 දිනැතිව නිකුත් කර ඇති මාර්ගොපදේශයේ දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | මාසික තැන්පතු සාරාංශ නිසි පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | **මුදල් රෙගුලාසි 571(1) හා (2)** | වර්ෂ 2 ක් ඉක්ම වූ රු.2,561,468 ක් ද, ආපදා කළමනාකරණ අංශයේ රු.830,525 ක් ද වූ පොදු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පත් මුදල් පිළිබඳව විස්තර ලබාගෙන අදාල තැන්පත්කරුවන් තහවුරු කර ගැනීමෙන් පසුව ගෙවීමට කටයුතු කර ඇත. | වර්ෂ 02 ක් ඉක්ම වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | **මුදල් රෙගුලාසි 751(2)** | මුදල් රෙගුලාසි 751(2) පරිදි කැබිතිගොල්ලෑව විශේෂ කාර්ය බලකා කඳවුරේ ගොඩනැගිලිවල ඇති විදුලි පංකා, අනෙකුත් විදුලි උපාංග හා ජල ටැංකි යනාදිය ලෙජර් ගතකර නොතිබුණි. | විශේෂ කාර්ය බලකායේ කැබිතිගොල්ලෑව කඳවුරේ ගොඩනැගිලිවල ඇති විදුලි පංකා, අනෙකුත් විදුලි උපාංග හා ජල ටැංකි යනාදිය ලෙජර්ගත කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වත්කම් ලෙජර්ගත කළ යුතුය. |
| (v) | **මුදල් රෙගුලාසි 752(4)** | ත්‍රිකුණාමල කඳවුරේ 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ ඌනතා, අතිරික්තතා පැවැතියද ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමල කඳවුරේ පැවති ජීව උණ්ඩ වෙඩි පුහුණු නිලධාරීන් වෙත නිකුත් කිරීමේදී තොග පොත් යාවත්කාලීන කිරීමට අතපසු වී ඇත. විශේෂ කාර්ය බලකායේ කන්තලේ කඳවුරෙහි සන්නිවේදන උපකරණ අළුත්වැඩියාවක් සඳහා වෙනත් කඳවුරකට ගෙනගොස් තිබූ බැවින් ඌනතාවයක් පෙන්නුම් කර ඇත. | භාණ්ඩ ඌනතා, අතිරික්තතා සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාම නිලධාරීන් පුහුණු කිරිමේ ව්‍යාපෘතියේ මෘදුකාංග සංවර්ධනය හා විවිධ කටයුතු සඳහා රු.15,352,353 ක් වැයකර තිබුණ ද ඊට අදාලව ග්‍රාම නිලධාරින් පුහුණු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ හේතුව නිසා වැයකළ මුදල නිෂ්කාර්ය වී තිබුණි. | අදහස් දක්වා නැත. | මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ලබා ගත හැකි පරිදි ග්‍රාම නිලධාරීන් පුහුණු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මටටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ හදිසි ආපදා තත්වයකදී විපතට පත්වන ප්‍රදේශවාසින් සඳහා විහාරස්ථානයේ සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරිමට රු.960,315 ක් වැයකර තිබුණ ද එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වරන්දන කන්ද ආශ්‍රිත පවුල් 19 ක් අධි අවදානම් සහිත පවුල් බවට 2016 මැයි මාසයේ සිදු කරන ලද භූ සමීක්ෂණ වාර්තාවෙන් නිශ්චය කර තිබුණ ද, 2021 පෙබරවාරි 18 වන විටත් පවුල් 13 ක් තවදුරටත් එම ස්ථානයේ පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. තවත් ආධාරලාභියෙකු සතුව අවධානමෙන් තොර ස්ථානයක කුඩා කඩයක් සහිත ඉඩමක් පැවතියද එම ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා රු.ලක්ෂ 12 ක් ලබාදීම වෙනුවට නව නිවසක් මිලදී ගැනීමට රු.ලක්ෂ 16 ක් ලබා දි තිබුණි. | අදහස් දක්වා නැත. | සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කළ යුතු අතර අවදානම් සහිත පවුල් අවදානම් ස්ථානවලින් ඉවත් කිරීමට හා ආධාර ලබාදීම මාර්ගෝපදේශයට අනුව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාතර දිස්ත්‍රික්කයේ ආපදාවන්ට ලක් වූවන්ට ප්‍රතිලාභ ලබා දීම. | | |
| (i) | ප්‍රතිලාභීන් සතු ඉඩමක නිවාස ඉදි කිරීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක ප්‍රතිලාභීන් 70 කට රු.73,898,280 ක් ගෙවා තිබුණ ද ප්‍රතිලාභීන් 21 දෙනෙකු අර්ධ වශයෙන් නිම වූ නිවාස වල පදිංචි වී තිබුණි. | අදහස් දක්වා නැත | ප්‍රතිලාභීන් ඉදිකිරීම් නිම කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක තෝරාගත් ප්‍රතිලාභීන් 49 කට රු.46,604,000 ක් නිවාස ඉදිකිරිමට හා 5 දෙනෙකුට ඉඩම් මිලදී ගැනීමට රු.2,000,000 ක් ලබාදී තිබුණ ද එම කටයුතු සිදුකර නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | කොටගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභියෙකුට රු.1,590,000 ක නිවසක් මිලදී ගැනීමට ලබා දී නිවස මිලදී ගෙන තිබුණි. එසේ වුවද එම නිවසේ පදිංචි වී නොතිබුණ අතර ආපදාවට ලක් වු නිවසේම පදිංචි වී තිබුණි. | - එම - | ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයන් අවදානම් ස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක ප්‍රතිලාභීන් 55 දෙනෙකුට රු.126,678,675 ක් ලබා දී තිබුණ ද වාරික 01 ක් 4 ක් අතර ලබාගත් ප්‍රතිලාභීන් 41 ක් නිවාසවල වැඩ නිමකර නොතිබුණි. ප්‍රතිලාභීන් 02 නෙකුගේ ඉඩම් වල් බිහිවී තිබුණි. | - එම - | ප්‍රතිලාභ උපයෝජනය කර ඉදිකිරීම් නිම නොකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v) | ප්‍රතිලාභියෙකු රු.1,200,000 ක් වැයකර ඉදිකර තිබු නිවසේ සැලැස්මට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අනුමැතිය ලබා දී නොතිබුණි. | - එම - | නිවාස සැලැස්මට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (vi) | ඉඩම් මිලදී ගත් ප්‍රතිලාභියෙකු නිවස ඉදිකිරීමේ කටයුතු නොකර ආපදාවට ලක් වූ ප්‍රදේශයේම පදිංචි වි සිටින බව නිරීක්ෂණය විය. තවද ප්‍රතිලාභීන් 07 දෙනෙකුට රු.1,900,000 ගෙවා තිබුණ ද ඉතිරි මුදල් ගෙවීමේ ප්‍රමාදය නිසා වැඩ නිම කිරීමට නොහැකි වී තිබුණි. | - එම- | ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයන් නිවාස ඉදිකර නායයෑම් අවදානම් ස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිලාභ ප්‍රමාදයකින් තොරව ලබා දිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ව්‍යාපෘතිය | | |
| (i) | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ආරාමයක් අසල පැවති ආපදා සහිත ගල ඉවත් කිරීමේදී කඩන ලද ගල් ඉවත් කිරීම සඳහා රු.123,594 ක් ගෙවා තිබුණ ද එම කාර්ය ඉටුකර නොතිබුණි. | අදහස් දක්වා නැත | අදාල කටයුතු නිම නොකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුරක්ෂිත මධ්‍යස්ථාන සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය යටතේ විහාරස්ථානයේ ගොඩනැගිල්ල වැඩිදියුණුව සඳහා ඇස්තමේන්තුව රු.969,483 ක් වුවද රු.481,035 ක අතිරේක වැඩ ඉටුකර තිබුණ බැවින් විචලනයේ ප්‍රතිශතය 49.6 ක් විය. | - එම - | ඇස්තමේන්තු අනුව ඉදිකිරීම් සැලසුම් කළ යුතුය. |
| (iii) | මොනරාගල දිස්ත්‍රික්කයේ කම්කරු නිවාස පිටුපස රැදවුම් බැම්ම ඉදිකිරීම සඳහා රු.4,605,400 ක වියදමක් දරා තිබුණද කලුගල් ඇතුරුම මත යොදන ලද කොන්ක්‍රීට් ස්ථරය සෝදාගොස් තිබුණු අතර රැදවුම් බැම්මේ ඇතැම් ස්ථාන ගල් මතු වී පලුදු වී තිබුණි. | - එම - | ඉදිකිරීම් නියමිත ප්‍රමිතියකට අනුව ඉටු කළ යුතුය. |
| (ඈ) | බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදාවන්ට ලක්වුවන්ට නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබා දීම. | | |
| (i) | බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් තුන්දෙනෙකු වෙත රු.599,925 ක් වන චෙක්පත් 03 ක් බාර දී නොතිබුණි. | අදහස් දක්වා නැත. | ප්‍රතිලාභින් වෙත ප්‍රතිලාභ ක්‍රමවත්ව ලබා දිය යුතුය. |
| (ii) | බදුල්ල දිස්ත්‍රික්කයේ 2020 පෙබරවාරි, නොවැම්බර් හා දෙසැම්බර් මාස වල නිවාස 68 ක් සඳහා මුලික බිම් සැකසීම හා අත්තිවාරම දැමීම සඳහා | - එම - | ප්‍රතිලාභ උපයෝජනය කර ඉදිකිරීම් අදාල ප්‍රමිතින්ට හා පිරිවිතරයන්ට අනුකූලව සිදු කළ |

| | | | |
|---|---|---|---|
| | රු.13,600,000 ක් ගෙවීම් කර තිබුණ ද, නිවාස 13 ක අත්තිවාරම දැමීම සිදුකර නොතිබුණි. නිවසක් වර්ග අඩි 650 ක් විය යුතු වුවත් නිසි ඇගැයීමකින් තොරව නිවාස 05 සඳහා මුදල් ගෙවීම් කර තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත නිවාස 51 ක් වෙනුවෙන් අත්තිවාරම් දැමීමේ කාර්යය සඳහා එකකට රු.180,000 ක් බැගින් රු.9,180,000 ක් ගෙවීම් කර තිබුණි. අත්තිවාරම් දමා තිබු නිවාස 30 ක වර්ග අඩි 71 ක් අඩුවෙන් ද තවත් නිවාස 22 ක වර්ග අඩි 26 ක් අඩුවෙන් ද විය. කොන්ත්‍රාත්කරු විසින් මූලික බිම් සැකසීමේ කටයුතු හා අත්තිවාරම කැපීම යන කාර්යයන් ඉටු කළ යුතු වුවද එම කාර්යය ප්‍රතිලාභීන් විසින් ඉටු කර තිබුණි. | | යුතුය. |
| (iii) | බදුල්ල දිස්ත්‍රික්කයේ දෙවන වාරික මුදල් ලෙස ප්‍රතිලාභීන් 31 ක් සඳහා රු.9,300,000 ක් 2020 දෙසැම්බර් මාසය තුලදී ගෙවීම් කර තිබුණ ද 2021 අප්‍රේල් 01 දින වන විටත් නිවාස 03 ක පමණක් බිත්ති බැඳීම ආරම්භ කිරීම සිදුකර තිබුණි. ඒ අනුව මුදල් ගෙවීම් සිදුකර මාස 03 ක් ගත වී ඇතත් දෙවන වාරික මුදලින් ඉටුකල යුතු කාර්යයන් ඉටුකර නොතිබුණි. | - එම - | ලබාදුන් ප්‍රතිලාභවලට අදාල ඉදිකිරීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් ප්‍රතිලාභියකු වෙත තම ඉඩමේ නිවස ඉදිකර ගැනීම සඳහා පළමු වාරිකය ලෙස රු.200,000 ක් 2020 සැප්තැම්බර් 16 දින ගෙවා තිබුණ ද 2021 මාර්තු මස 22 දින වන විටත් අත්තිවාරම දමා නොතිබුණි. | - එම - | ප්‍රතිලාභ උපයෝජනය කර ඉදිකිරීම් නොකළ අය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් ප්‍රතිලාභියෙකුට ඉඩම මිලදී ගැනීම සඳහා රු.400,000 ක් සහ නිවස ඉදිකිරීම සඳහා පළමු වාරිකය ලෙස රු.200,000 ක් ගෙවා තිබුණි. එහෙත් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ සඳහන් පරිදි පළමු වාරිකය මුදාහැරීම සඳහා නිවාස සැලසුමට අනුමැතිය හාලි ඇල ප්‍රාදේශීය සභාවෙන් විගණිත දිනය වූ 2021 මාර්තු 18 දින වන විටත් ලබා ගෙන නොතිබුණි. | - එම - | මාර්ගෝපදේශයට අනුව නිවාස සැලසුම් අනුව නිසි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | හපුතලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කහගල වත්ත දෙමළ විද්‍යාලයේ සුරක්ෂිත මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.967,828 ක වියදමක් දරා කොන්ක්‍රීට් කරන ලද බිම් කොටසේ ස්ථාන 12 ක දිග මීටර් 26.92 ක ඉරිතැලීම් විය. | - එම - | සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදි කිරීම් නියමිත ප්‍රමිතියකට අනුව සිදු නොකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (vii) | දඹේතැන්න බණ්ඩාර එලිය අංක 02 දෙමළ විද්‍යාලයේ සුරක්ෂිත මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට රු.970,017 ක වියදමක් දරා තිබුණි. කොන්ක්‍රීට් කර සිමෙන්ති මැදීම සිදුකර තිබූ කොටසෙහි ස්ථාන 05 ක දිග මීටර් 12.20 ක ඉරිතැලීම් නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඉ) | කළුතර දිස්ත්‍රික්කයේ ආපදාවන්ට ලක්වූවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබා දීම. | - | - |
| (i) | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත 2017 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු. 1,363,413,225 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.929,986,597 වැය කර තිබුණි. රජයෙන් ලබාදුන් ඉඩමක නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් 1,200,000 බැගින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 ක ප්‍රතිලාභීන් | අදහස් දක්වා නැත. | ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය කර නිවාස ඉදිකිරීම් නොකළ ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 355 ක් හඳුනා ගෙන රු.310,466,530 ක් ප්‍රදානය කර තිබුණි. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 13 දෙනෙකු නිවාස ඉදි කිරීම් කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | ප්‍රතිලාභීන් 25 දෙනෙකු සඳහා සිව්වන වාරිකය දක්වා ගෙවා තිබුණ ද නිවාස ඒකක 37 ක් වැඩ අවසන් කර නොතිබුණි. | - එම - | ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය කර නිවාස ඉදිකිරීමට අවශ්‍ය තාක්ෂණය සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (iii) | ප්‍රතිලාභියා මිලදී ගත් ඉඩමට රු.400,000 ක් සහ එම ඉඩමේ නිවසක් ඉදිකිරීමට රු.1,200,000 ක් ලබාදීමේ ක්‍රමවේදය යටතේ කළුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කින් ප්‍රතිලාභීන් 267 දෙනෙකු තෝරා ගෙන තිබුණි. ඒ අනුව ඉඩම් මිලදීගැනීමට රු.105,695,000 ක් සහ එම ඉඩම් වල නිවාස ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දක්වා රු. 245,151,418 ක් ලෙස එකතුව රු.350,846,418 ක ප්‍රතිලාභ ලබා දී තිබුණි. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08 ක ප්‍රතිලාභීන් 139 දෙනෙකු නිවාස නිමකර නොතිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (iv) | නිවාස හානි වූ ප්‍රතිලාභීන් විසින් තමන්ට හිමි වෙනත් ආරක්ෂිත ස්ථානයක නිවසක් ඉදිකිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක ප්‍රතිලාභීන් 135 වෙත රු.92,097,649 ක් ගෙවා තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ප්‍රතිලාභීන් 72 නෙකු නිවාස ඉදිකිරීම් නිමකර නොතිබුණි. නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක ප්‍රතිලාභීන් 122 දෙනෙකු රු.179,676,000 ක් ලබා දී තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ප්‍රතිලාභීන් 12 දෙනෙකු නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය නොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඊ) | මාතලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පුරිජ්ජල ග්‍රාම නිලධාරී වසමේ පදිංචිකරුවෙකු වෙනුවෙන් ලද රු.36,012 ක ප්‍රතිලාභ විගණන අවස්ථාව වන විටත් ගෙවා නොතිබුණි. මාතලේ, දඹුල්ල, උකුවෙල හා නාඋල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විගණන අවස්ථාව වන තෙක් නිවාස හානි වන්දි ගෙවීම් සිදුකර නොතිබුණු අවස්ථා 23 ක් නිරීක්ෂණය විය. මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපදා අවස්ථා 06 කට අදාළව සහ උකුවෙල ප්‍රාදේශීය ලේකම් විසින් ආපදා අවස්ථා 02 කට අදාළව වන්දි මුදල් අයදුම්පත් මාර්ගෝපදේශයට අනුව ඉදිරිපත් කර නොතිබුණි. මාර්ගෝපදේශයට අනුව මාතලේ සහ උකුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවලට අයත් ස්වභාවික ආපදා තත්ත්වයන් මාර්ග ගත දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | පරිගණකවල පවතින දෝෂ, අලුත්වැඩියා කරගැනීමට නොහැකි වීම, අන්තර්ජාල පහසුකම්වල පවතින දුර්වලතා හා තාක්ෂණ ගැටලු වැනි හේතුන් නිසා අයදුම්පත්වලට අදාළ තොරතුරු මාර්ගගත තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බවද කාරුණිකව දන්වමි. | නිවාස හානි සඳහා වන්දි ප්‍රමාදයකින් තොරව ලබා දිය යුතු අතර ස්වාභාවික ආපදා තත්වයන් මාර්ගගත දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුය. |

**3.3 වෙනත් නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදා නිවාස අරමුදල් ගිණුමට බැර කල යුතු රු.199,975 ක චෙක්පතක් ප්‍රතිලාභියාගේ පෞද්ගලික ගිණුමකට බැරකර ගෙන තිබුණි. එම ආපදා නිවාස අරමුදල් ගිණුමට බැරකර ගැනීමට හෝ ආපසු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | ප්‍රතිලාභ චෙක්පත් නිවැරදිව ගිණුමට බැර කළ යුතුය. |
| (ආ) | බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් විසින් ආපදා නිවාස අරමුදල් ගිණුමේ තැන්පත් නොකර රු.899,900 ක් වූ චෙක්පත් 04 ක් රඳවාගෙන තිබීම නිසා කාලය ඉකුත් වීම හේතුවෙන් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බාර දී තිබුණි. | - එම - | ප්‍රතිලාභින් වෙත ප්‍රතිලාභ ප්‍රමාදයකින් තොරව ලබා දිය යුතුය. |
| (ඇ) | මාර්ගෝපදේශය අනුව ප්‍රථම වාරික මුදල් නිදහස් කිරීම සඳහා ආකෘති අංක 03 හි දී ඇති අධීක්ෂණ පත්‍රිකාව භාවිතා කලයුතු බව දක්වා තිබුණ ද බදුල්ල දිස්ත්‍රික්කයේ එම ආකෘති පත්‍රය භාවිතා නොකර නිවාස 51 ක් වෙනුවෙන් රු.9,180,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. | - එම - | වාරික මුදල් නිදහස් කිරීමේදී මාර්ගෝපදේශයේ දක්වා ඇති ආකෘති පත්‍ර උපයෝගිකරගත යුතුය. |
| (ඈ) | මාතලේ දිස්ත්‍රික්කයේ ආපදා හේතුවෙන් හානියට පත් නිවාස සඳහා නිවාසාධාර අත්තිකාරම් සහ වන්දි මුදල් ගෙවීමේදී ආපදා කළමනාකරණ මාර්ගෝපදේශ අංක 01/2020 අනුව කටයුතු නොකල අවස්ථා නිරීක්ෂණය විය. මාර්ගෝපදේශයේ 4(v) හි සඳහන් පරිදි අත්තිකාරම් මුදල් ගෙවීම් කටයුතු සිදු නොකර ප්‍රතිපාදන ලැබී දින 14 ත්, මාස 02 යි දින 10 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එකතු වටිනාකම රු.198,000 ක මුදලක් ප්‍රතිලාභීන්ට අවස්ථා 20 ක දී ගෙවා තිබුණි. උකුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මුවගල ග්‍රාම නිලධාරී වසමට අයත් ප්‍රතිලාභියෙකු සහ ඉඹුල්පිටිය වසමේ ප්‍රතිලාභියෙකු | නිරීක්ෂණ හා එකඟ වේ. පරිගනක වල අලුත්වැඩියාවන් සිදුකර ගැනීමට නොහැකිවීම හා අන්තර්ජාල පහසුකම්වල පවතින දුර්වලතා හේතුවෙන් තොරතුරු මාර්ගගත තොරතුරු පද්ධතියට ඇතුලත් කළ නොහැකි විය. පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් අදාළ කාර්යන් කඩිනමින් සිදුකරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කර ඇත. | ප්‍රතිලාභින්හට ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලැබී තිබුණි. එහෙත් ගෙවිය යුතු රු.10,000 ක, අත්තිකාරම් මුදල් ගෙවීම විගණිත අවස්ථාව වන විටත් සිදුකර නොතිබුණි. | | |
| (ඉ) | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල වගා ළිං 03 ක් ඉදිකිරීම සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පුද්ගලික ආයතනයක් සමග රු.3,094,977 ක් වූ ගිවිසුම් දෙකකට එළඹ තිබුණ ද 2006 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ අංක 89(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ඒ සඳහා ලබාගෙන නොතිබුණි. වෙහෙරගල ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරන ලද වගා ළිදෙහි ළිඳ කැපීම හා ළිං බැම්ම වටා පස් පිරවීම සඳහා රු. 90,000 ක් ගෙවා තිබුණද ළිදේ බැම්ම වටා පස් පුරවා නොතිබුණි. | අදහස් දක්වා නැත. | වගා ළිං ඉදි කිරීම සඳහා නිසි පරිදි අනුමැතිය ලබාගෙන ළිං ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

---------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වදේශ කටයුතු අංශය මගින් රාජ්‍ය අවමංගල්‍ය උත්සවය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබූ ප්‍රතිපාදනය රු.මිලියන 06 ක් වුවද එම ප්‍රතිපාදන ඉක්මවා රු.592,305 ක් වැයකර තිබුණි. එම ඉක්මවීම සම්බන්ධයෙන් නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. හිරු ආවරණ, ශබ්ද විකාශන යන්ත්‍ර සහ ජෙනරේටර් යනාදිය කැළණිය ප්‍රදේශයේ පිහිටි ආයතනකින් සපයා ගැනීම හේතුවෙන් අවමංගල්‍ය උත්සවය පැවති හැටන්, නෝවුඩ් ප්‍රදේශය වෙත රැගෙන යාමේ ප්‍රවාහන වියදම් ලෙස රු.333,200 ක් දැරීමට සිදුව තිබුණි. මෙම කාර්යය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයද අනුගමනය කර නොතිබුණි. | තොරතුරු අනුව මේ සඳහා වෙන් කර ඇත්තේ මිලියන 6 ක මුදලක් බව අදාළ අංශ විසින් මා වෙත දන්වා ඇත. | වියදම් සඳහා නිසි අනුමැතිය ලබා ගත යුතුය. |

**3.5** හානි හා පාඩු

--------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ------------------------------ | ----------------- |
| (අ) | 2016 ඔක්තෝබර් 03 දින විශේෂ කාර්ය බලකායේ ගාල්ල කඳවුරේ GPS යන්ත්‍ර අස්ථානගත වීමෙන් වූ අලාභය රු.73,672 ක් ලෙස අලාභහානි ලේඛනයේ සටහන් වී තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. විශේෂ කාර්ය බලකායේ අලාභහානි සිදු වී වර්ෂ 03 ත් වර්ෂ 04 ත් අතර කාලයක් ගතවී තිබුණු අලාභ හානි 02 ක එකතු වටිනාකම වූ රු.4,756,200 ක අලාභය වගකිවයුතු පාර්ශවවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | GPS යන්ත්‍රය අස්ථාන ගත වීමෙන් සිදු වූ අලාභය අතපසුවීමකින් අලාභ හානි ලේඛණයේ ඇතුලත් කර නොමැත. මෙම අලාභය සම්බන්ධයෙන් මු.රෙ.103 (1) (ඊ) ප්‍රකාරව කටයුතු කර ඒ සඳහා වගකිව යුතු නිලධාරියාගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන් වමි. | සිදුවන අලාභහානි ලේඛන ගත කළ යුතු අතර අලාභ හානි ඊට වගකිවයුතු පාර්ශවයන්ගේන් අයකර ගත යුතුය. |
| (ආ) | විශේෂ කාර්ය බලකායේ එකතු වටිනාකම රු.132,058 ක් වූ අලාභයන් 03 ක් හානි පාඩු ලෙස සටහන් කිරීමට වර්ෂ 6 සිට වර්ෂ 35 දක්වා කාලයක් ගත වී තිබුණි. | විශේෂ කාර්ය බලකාය වෙත සිදු වී ඇති සමහර අලාභයන් එම අලාභ සිදු වී දිගු කාලයකට පසුව ලියාපදිංචි කිරීම සිදුකර ඇත. | හානි පාඩු ප්‍රමාදයකින් තොරව සටහන් කළ යුතුය. |
| (ඇ) | විශේෂ කාර්ය බලකායට අයත් ජීප් රථයක් 2020 නොවැම්බර් 04 දින අනතුරකට පත් වී රු.1,798,583 ක අලාභයක් සිදු වී ඇති බව පාඩු හා හානි ලේඛනයේ සඳහන් කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් නොකෙරුණි. | මෙම අලාභය සිදු වී ඇත්තේ 2020 නොවැම්බර් 04 වන දින වන අතර පරීක්ෂණ මණ්ඩලය පත්කර අලාභය තක්සේරු කිරීම සිදු කරන විට 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කර අවසන් වී තිබුණි. එබැවින් එම මූල්‍ය ප්‍රකාශන වලට මෙම අනතුරෙහි අලාභය ඇතුලත් වී නොමැත. | ආදාල හානි පාඩු මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශේෂ කාර්ය බලකායේ 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදු වී ඇති වර්ෂ 02 සිට වර්ෂ 13 ක කාලයකට අදාල වාහන අනතුරු 10 කට අදාල රු.8,108,879 ක අලාභ අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට හෝ ක්‍රියාකර නොතිබුණි. | නිරික්ෂණ හා එකඟ වේ. | අලාභ සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ස්වදේශ කටයුතු අංශයේ 2017 වර්ෂයේ සිදුවූ වාහන අනතුරක් සම්බන්ධයෙන් වගකිවයුතු හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ මහජන සබඳතා නිළධාරී ගෙන් අයකරගත යුතු රු.26,277 ක් 2021 අප්‍රේල් 22 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | අලාභහානි අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. යහපාලනය**

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හදිසි ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහා ආධාර එකතු කිරීම අරමුණු කරගෙන විවෘත කළ බැංකු ගිණුමට 2020 දෙසැම්බර් 31 දින වන විට දේශීය හා විදේශීය පරිත්‍යාගශීලින්ගෙන් හා චීන රජයෙන් ලැබී තිබුණු මුදල රු.මිලියන 294.75 ක් විය. කෙසේ වෙතත් මෙම අරමුදල් ආපදා සහන සේවා කටයුතු සඳහා යොදාගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන මෙම රු.මිලියන 294.75 ක මුදල භාවිත කර නායයෑම් අධි අවදානම් ස්ථාන වල ජීවත්වන පවුල් සඳහා නැවත සුරක්ෂිත ස්ථාන වල නිවාස ඉදිකර දීමට සැලසුම් සකස් කර ඇති බව දන්වමි. | පරිත්‍යාගශීලින්ගෙන් ලබාගත් මුදල් අරමුණු ඉටුවන පරිදි යෙදවිය යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංශ 5 තුල තනතුරු පුරප්පාඩු 3108 ක් පැවතුණි. | ඉදිරියේදී පුරප්පාඩු වී ඇති කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |